# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2452/40 - 2025 සැප්තැම්බර් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2025.09.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**එල්.ඩී.බී. 24/1951 (XVII)**

### (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 151 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**බිමල් නිරෝශන් රත්නායක,**
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ,
සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2025 සැප්තැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 2025 අංක 01 දරන මෝටර් වාහන (මත්ද්‍රව්‍ය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) කිසියම් මාර්ගයක මෝටර් වාහනයක්, පදවනු ලබන, ක්‍රියාත්මක කරනු ලබන හෝ සත්‍ය වශයෙන් යම් මෝටර් වාහනයක් කායිකව පාලනය කරනු ලබන යම් තැනැත්තකු මත්ද්‍රව්‍ය භාවිතා කර ඇති බවට පොලිස් නිලධරයකු විසින් සාධාරණව සැක කරනු ලබන අවස්ථාවක දී ඒ පොලිස් නිලධරයා විසින් ඒ තැනැත්තා රජයේ වෛද්‍ය නිලධරයකු හෝ රෝහල විසින් තත්කාර්ය සඳහා බලය දෙන ලද යම් නිලධරයකු වෙත වැඩිදුර පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් කළ යුතු ය.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) යම් පොලිස් නිලධරයකුට -

(අ) යම් රියදුරකුගේ සමේ යම් අසාමාන්‍ය හෝ ප්‍රතික්‍රියාවක් දනවන පෙන්නුම් කිරීමක් හෝ අස්වාභාවික හැසිරීමක්;

(ආ) රියදුරුගේ කථාව, ක්‍රියාව, චලනය හෝ සමබරතාවය;

(ඇ) මත්ද්‍රව්‍ය අධිග්‍රහණය වී ඇති බවට හඟවනු ලබන රියදුරුගේ ඇස්වල පෙනුම;

(ඈ) මත්ද්‍රව්‍ය ගෙන ඇති බවට පෙන්නුම් කරන්නා වූ රියදුරන්ගේ ආකල්ප හෝ රියදුරුගේ ඇඳුම්වල පෙනුම;

(ඉ) මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ රියදුරකුට එරෙහිව සාධාරණ තොරතුරු මත පදනම්ව පවත්වනු ලබන විමර්ශනයක් හෝ පැමිණිල්ලක්;

(ඊ) තත් කාර්ය සඳහා පොලිස්පතිවරයා විසින් අනුමත කරන ලද උපකරණයක් භාවිත කරමින් පවත්වන ලද බේට පරීක්ෂාවක්;

මගින් නිරීක්ෂණය වන්නේ නම්, (1) වන අනුනියෝගයේ සඳහන් කරන ලද සාධාරණ සැකයක් ඔහු වෙත ඇති විය හැකි ය.

(3) (2) වන අනුනියෝගයේ (ඊ) ඡේදයේ සඳහන් කර ඇති බේට පරීක්ෂාවක් සඳහා බේට සාම්පලයක් සැපයීමට නියම කර ඇති යම් රියදුරකු විසින් ඒ සාම්පලය පොලිස් නිලධරයා විසින් සලසා දෙන ලද සාධාරණ වාතාවරණයන් යටතේ ලබාදිය යුතු ය.

(4) (3) වන අනුනියෝගයේ සඳහන් කර ඇති පරිදි එවැනි යම් සාම්පලයක් ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලබන යම් රියදුරකු රජයේ වෛද්‍ය නිලධරයකු හෝ බලයලත් නිලධරයකු වෙත පරීක්ෂණය සඳහා හැකිතාක් ඉක්මනින් ඉදිරිපත් කළ යුතු ය.

(5) තත් කාර්ය සඳහා පොලිස්පතිවරයා විසින් අනුමත කරන ලද යම් උපකරණයක් භාවිත කරමින් පොලිස් ස්ථානයක දී හෝ වෙනත් යම් පහසු ස්ථානයක දී පොලිස් නිලධරයා විසින් බේට පරීක්ෂාවක් සිදු කරනු ලැබිය හැකිය.

(6) බේට පරීක්ෂාවක් සිදු කරනු ලබන පොලිස් නිලධරයකු විසින් බේට පරීක්ෂාවක් සිදු කරමින් පවතින බවට මහජනතාවට පහසුවෙන් නොපෙනෙන බව තහවුරු කිරීමට සාධාරණව ගත හැකි අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය යුතු ය.

(7) (6) වන අනුනියෝගය යටතේ වන පරීක්ෂණයකින් පසුව, රියදුරු යම් මත්ද්‍රව්‍යයක් හෝ මත්ද්‍රව්‍ය මිශ්‍රණයක් භාවිත කර ඇති බවට පොලිස් නිලධරයා සෑහීමට පත්වන අවස්ථාවක දී, ඒ රියදුරු හැකිතාක් ඉක්මනින් රජයේ වෛද්‍ය නිලධරයකු හෝ රජයේ රෝහලක බලයලත් නිලධරයකු වෙත වැඩිදුර පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

3. රජයේ වෛද්‍ය නිලධරයකු හෝ බලයලත් නිලධරයකු විසින්, 2 වන නියෝගයේ (1) වන හෝ (7) වන අනුනියෝගය යටතේ ඔහු වෙත ඉදිරිපත් කරන ලද යම් රියදුරකු පිළිබඳව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද පරීක්ෂණ ක්‍රමයකට අනුකූලව පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර, ඒ රියදුරු විසින් යම් රජයේ වෛද්‍ය නිලධරයකු හෝ බලයලත් නිලධරයකුගේ ඉල්ලීම පරිදි පරීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය රුධිර, මූත්‍රා, බේට හෝ වෙනත් ශාරීරික ශ්‍රාවයන්වල සාම්පලයක් ඒ රජයේ වෛද්‍ය නිලධරයාට හෝ බලයලත් නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

4. 3 වන නියෝගයේ සඳහන් කර ඇති පරිදි, යම් සාම්පලයක් ලබා දීම ප්‍රතික්ෂේප කරනු ලබන යම් රියදුරකු සම්බන්ධයෙන් (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 151 වන වගන්තියේ (1ඇ) උපවගන්තියේ (ඉ) ඡේදයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

5. රජයේ වෛද්‍ය නිලධරයකු හෝ බලයලත් නිලධරයකු විසින්, 3 වන නියෝගය යටතේ ඔහු විසින් පවත්වනු ලබන පරීක්ෂණයකින් පසුව යම් තැනැත්තකු විසින් යම් මත්ද්‍රව්‍යයක් හෝ මත්ද්‍රව්‍ය මිශ්‍රණයක් භාවිත කර ඇති බව සොයාගනු ලැබුවහොත්, 7 වන නියෝගයේ සඳහන් විද්‍යාගාර පරීක්ෂණයේ ප්‍රතිඵලවලට අනුකූලව අවසාන වාර්තාව ලබාදෙනු ලබන තෙක් ඔහු විසින් මූලික වාර්තාවක් අදාළ නීතිමය කටයුතු සඳහා ලබා දිය යුතු ය.

6. රජයේ වෛද්‍ය නිලධරයකු හෝ බලයලත් නිලධරයකු විසින්, 3 වන නියෝගය යටතේ ඔහු විසින් පවත්වනු ලබන පරීක්ෂණයක් මගින් ඒ තැනැත්තා මත්ද්‍රව්‍ය භාවිත කර ඇති බව සොයාගනු නොලැබුවහොත් ඒ පරීක්ෂණය සිදු කරනු ලැබ ඇති වෛද්‍ය නිලධරයා හෝ බලයලත් නිලධරයා විසින් ඒ පිළිබඳ වාර්තාවක් පොලිස් නිලධරයාට ලබා දිය යුතු ය.

7. 3 වන නියෝගයේ සඳහන් කර ඇති පරිදි රජයේ වෛද්‍ය නිලධරයකු හෝ බලයලත් නිලධරයකු විසින් පවත්වනු ලබන පරීක්ෂණයක දී ඒ තැනැත්තා මත්ද්‍රව්‍ය භාවිත කර ඇති බවට සොයාගනු ලැබූ අවස්ථාවක දී ඒ තැනැත්තාගෙන් ලබා ගත් ඒ රුධිරයේ, මුත්‍රවල, ඛේටයේ හෝ වෙනත් ශාරීරික ශ්‍රාවයන්වල සාම්පලයකින් යම් කොටසක්, එවැනි සාම්පල පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද රජයේ ආයතනයකට හෝ රසායනාගාරයකට ඉදිරිපත් කළ යුතු ය.

8. රජයේ වෛද්‍ය නිලධරයකු හෝ බලයලත් නිලධරයකු විසින්, 7 වන නියෝගයේ සඳහන් කර ඇති පරිදි සාම්පලය පිළිබඳ පවත්වන ලද රසායනාගාර පරීක්ෂණයේ ප්‍රතිඵල පරීක්ෂා කිරීමෙන් පසුව ඒ අවසාන වාර්තාව අධිකරණ බලය සහිත පොලිස් ස්ථානාධිපතිවරයාට හෝ ඔහු විසින් බලය දෙන ලද පොලිස් නිලධරයකු වෙත හෝ භාරදිය යුතු ය.

9. රජයේ වෛද්‍ය නිලධරයා හෝ බලයලත් නිලධරයකු විසින් නිකුත් කරන ලද අවසාන වාර්තාවට අනුව රියදුරුගෙන් ලබාගත් ඒ රුධිර, මුත්‍ර, ඛේට හෝ වෙනත් ශාරීරික ශ්‍රාවයන්ගේ සාම්පලයේ යම් මත්ද්‍රව්‍යයක් යම් ප්‍රමාණයකට අඩංගු වන බව තහවුරු වන්නා වූ අවස්ථාවක දී, ඒ රියදුරා මත්ද්‍රව්‍ය භාවිත කර ඇති බවට සලකනු ලැබිය යුතු ය.

10. මේ නියෝගවල කාර්ය සඳහා -

"මත්ද්‍රව්‍ය" යන්නෙන්, (218 වන අධිකාරය වූ) විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ තුන්වන උපලේඛනයේ "ආ" කාණ්ඩයේ සඳහන් යම් මත්ද්‍රව්‍යයක් සහ 2008 අංක 1 දරන මාදක ඖෂධ සහ මනෝ වර්තක නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනතේ තුන්වන උපලේඛනයේ I වන කොටසේ සහ II වන කොටසේ සහ හතරවන උපලේඛනයේ I වන කොටසේ, II වන කොටසේ, III වන කොටසේ සහ IV වන කොටසේ ඇතුළත් කර ඇති මාදක ඖෂධ සහ මනෝ වර්තක අදහස් වේ; සහ

"රජයේ වෛද්‍ය නිලධරයා" යන්නෙන්, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි ශ්‍රී ලංකාව තුළ යම් රජයේ හෝ රජයට අනුබද්ධ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල ආයතනයක සේවයේ නියුතු සුදුසුකම්ලත් වෛද්‍ය වෘත්තිකයකු අදහස් වේ;

EOG 09 - 0053

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.